සැ. යු.- 2011.11.04 වැනි දින පළ වූ අංක 1,731 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2010 වර්ෂයට අදාල හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලිය පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


අංක 1,732 - 2011 නොවැම්බර් මස 11 වැනි සිකුරාදා - 2011.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | 670 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 670 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා සියලු ම දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 නොවැම්බර් මස 18 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 නොවැම්බර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

ටෝකියෝ සිමෙන්ට් කලම්බු ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 516, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

නඩු අංකය : එස්එම් 466/09
ඇස්කීසි අංකය : 94/2011

................................................................................පැමිණිලිකරු.

එදිරිව

1. සිරිවර්ධන කන්කානමගේ ක්‍රිෂාන්ත උපුල් කුමාර
2. මැල්ලවතන්ත්‍රීගේ නිල්කා ක්‍රිෂාන්ති කරුණාරත්න නොහොත් පෙරේරා

"ශ්‍රී කේසර එන්ටර්ප්‍රයිසස්" නාමය විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් ගම්පහ කටුගස්පාර අංක ඊ 54 හි පවත්වාගෙන යති

................................................................................විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩුවේ 2010 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු රුපියල් 3,00,200 ක මුදල ද, ඒ මුදල සඳහා පැමිණිල්ලේ සඳහන් දිනයේ සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා එදින සිට තීන්දු ප්‍රකාශයේ සමාහාර මුදල මත නෛතික පොළිය සහ අධිකරණයෙන් තක්සේරු කරන ලද නඩු ගාස්තු ද, අයකර ගැනීම සඳහා වර්ෂ 2011 ක්වූ ජුනි මස 23 වන දින මා වෙත නිකුත් කරන ද දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසිය යටතේ තහනමට ගන්නා ලද ඉහත නම සඳහන් 2 වැනි විත්තිකාරියට අයත් පහත උපලේඛනයේ විස්තර වන දේපළ 2011 ක් වූ දෙසැම්බර් මස 09 වැනි දින ප.ව. 2.00 ට එම දේපළ පිහිටි ගම්පහ කටුගස්පාර අංක ඊ 54 යන ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ දාසියා පත්තුවේ අස්ගිරි වල්පොල ග්‍රාමයේ පිහිටි නැදුන්ගහවත්ත නමැති ඉඩමට ඉන්දුතිස්ස කොටබගේ, මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 118/2006 හා වර්ෂ 2006 ක් වූ සැප්තැම්බර් මස 02 වැනි දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක ඒ යන කැබැල්ලට මායිම්, උතුරට : චන්දන දැඩිගම හිමිකම් කියන ඉඩමද, නැගෙනහිරට : ටී. මයිකල් සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : පාර (PS), බස්නාහිරට : පොඩිනෝනා හිමිකම් කියන ඉඩම ද, අඩි 15 පළල පාර ද, චන්දන වික්‍රමාරච්චි හිමිකම් කියන ඉඩම ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දොළහයි දශම හතරයි හයක් (අ. 0, රූ. 1, පර්. 12.46) විශාල ඉඩම සහ එහි පිහිටි ඊට අයත් ගහකොළ පළතුරු ආදී සියලු දේද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 409/90 දරන වෙළුමේ සහ පත්‍රිරුවේ ලියාපදිංචි වී ඇත. (මෙම විකිණීම කරනු ලබන්නේ ශ්‍රී ලංකා මර්චන්ට් බැංකුව සතු අංක 870 සහ 2008.11.07 උකස්කරයේ හිමිකම් පැමට යටත්වය).

රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය,
ගම්පහ.

වර්ෂ 2011 ක් වූ ඔක්තෝබර් මස 24 වැනි දින දී ය.

11-293

# නොතාරිස් ලැයිස්තුව

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 04 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම කර තිබේ.

බොරලැස්ගමුව, එගොඩවත්ත පාර, අංක 75/8හි ප්‍රධාන කාර්යාලය සහිතව, බොරලැස්ගමුව, එගොඩවත්ත පාර, අංක 75/8හි පදිංචි, ඊශ්වරී අසෝකා සිරිවර්ධන මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 12 වැනි දින,
කොළඹ 07.

11-254/1

## නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වැනි වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම කර තිබේ.

(01) ගාල්ල, දංගෙදර, එළියට් පාර, ක්‍රීඩාපිටිය මාවත, අංක 9/1ඒ හි පදිංචි, සේවින්ද සූරිආරච්චි මහතා, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(02) ඉඹුල්ගොඩ, පහළ ඉඹුල්ගොඩ, අංක 1/44හි පදිංචි, පාවුළු මණ්ඩඩිගේ උදිත සුමේධ ජයතිලක මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(03) කිරිවත්තුඩුව, පිටිපන දකුණ, "අඹහේන", අංක 251/2බී/7 හි පදිංචි, කපුගම ගීගනගේ චන්ද්‍රානි මොනිකා දිල්රුක්ෂි මහත්මිය, අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්වරියක වශයෙන්,

(04) අගලවත්ත හරහා, බෙල්ලන, පන්සල අසල හි පදිංචි, ඉද්දගොඩ, හේවාගේ දොන් ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා, කළුතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(05) ගාල්ල, අක්මීමණ, ගනේගොඩ, කමල් ඉලෙක්ට්‍රිකල්ස් හි පදිංචි, අලවත්ත කංකානම්ගේ නදීකා ප්‍රසංගනී මෙනෙවිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(06) අවිස්සාවේල්ල, මානියම්ගම, "රම්‍ය" හි පදිංචි, කුරුවේගෙයි අසංක සේනාරත්න මහතා, අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 12 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

11-254/2

---

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම කර තිබේ :-

(01) හල්ග්‍රන්ඔය, ශාන්ත ලෙනාඩ්ස් වත්ත, අංක 30හි පදිංචි, සිංගරාජා මෝහනරාජන් මහතා, නුවරඑළිය අධිකරණ කලාපය තුළ දෙමළ භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(02) දාරලුව (වයඹ), "අශෝකා", අංක 639/1හි පදිංචි, දිසානායක මුදියන්සේලාගේ ඉරෝමා විජයමාලි දිසානායක මෙනෙවිය, කුරුණෑගල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(03) මාතර, ඌරුබොක්ක, අමුහේන්ගොඩ, අංක එස්-31හි පදිංචි, හේවා මීඇල්ලගේ ලලිත් ප්‍රියන්ත ජයනාද මහතා, මාතර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(04) හෝමාගම, පිටිපන උතුර, අංක 558 ඒ හි පදිංචි, මෙස්ටියගේ කුසලා ගුණතිලක මෙනෙවිය, අවිස්සාවේල්ල අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 01 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

11-254/3

### නොතාරිස් ආඥාපනත (පත් කිරීම්)

නොතාරිස් ආඥාපනතේ 03 වන වගන්තිය යටතේ, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින් පහත සඳහන් පත්වීම කර තිබේ :-

(01) අඹතැන්න, මාතලේ පාර, අංක 54හි පදිංචි, උපේඛා පියුමාලි කුමාරි තෙන්නකෝන් මෙනෙවිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(02) ලෙව්ල, කැටවල, අංක 118හි පදිංචි, නිරෝෂණ මංජුල අරුද්සෝති මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(03) කොළඹ 03, රොටුන්ඩා පෙදෙස, අංක 7, වයි. ඩබ්. සී. ඒ. කාන්තා නේවාසිකාගාරය හි පදිංචි, අලුත් ගෙදර ජනනී අමා විමලසේන මෙනෙවිය, කොළඹ අධිකරණ කලාපය තුළ ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(04) කටුගස්තොට, රණවන පාර, අංක 257/1හි පදිංචි, මල්ලව ආරච්චිගේ සශ්‍රීකා චන්ද්‍රවංශ මහත්මිය, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(05) කොළඹ 15, මට්ටක්කුලිය, ජුබිලි මාවත, අංක 50/31හි පදිංචි, ගංගොඩ ආරච්චිගේ රුමාලි නිසංසලා පෙරේරා මහත්මිය, කොළඹ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(06) ගාල්ල, වංචාවල, මැලෑගොඩ, "ගයානි" හි පදිංචි, දුලිප් කුමාර තිරාණගම මහතා, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(07) පැපිලියවල, වේරහැර, අංක 176/1 හි පදිංචි, පත්බේරියගේ තුෂාර ලක්ෂ්මන් විජේසිංහ මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(08) අහංගම, දික්කුඹුර, කළුවගහවත්ත හි පදිංචි, ගොඩේ ලියනගේ කමනි කල්පනා ගයනි නානායක්කාර මෙනෙවිය, ගාල්ල අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(09) පැපිලියවල, පල්ලේගම, හොලිපොල්ගහවත්ත, අංක 55/2/එෆ් හි පදිංචි, සමරප්පුලිගේ ජයසේන මහතා, ගම්පහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්,

(10) නත්තරම්පොත, අරංගල පාර, අංක 28හි පදිංචි, ගයාන් හෂීල හීන්කෙන්ද මහතා, මහනුවර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන්.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2011 ඔක්තෝබර් මස 13 වැනි දින,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

11-254/4

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.